# බදු හා මහජන නියෝජිතයෝ

පසුගියදා ජනාධිපතිතුමා විද්වතුන් අමතා කළ කතාව ඉතිහාසගත වන්නකි. මෙරට විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය සතු බලතල, බදු පැණවීම, සටන් විරාමය, කොටි පැරදවීම හා ඒකීය ලංකාව ගැන ඉතා පැහැදිලි විස්තරයක් එතුමා ඒදින කෙළේ ය. අනාගතයේ දී දේශපාලන විචාරකයන්ට හා ඉතිහාසඥයන්ට මේ කතාව මෙරට ඉතිහාසයේ සන්ධිස්ථානයක දී සිදුකරන ලද වැදගත් කතාවක් ලෙස හැඳින්වීමට සිදුවනු ඇත.

ඒ කතාවෙන් කියැවුණු කරුණු දෙකක් ගැන විවරණයක් කිරීම මෙහි අරමුණ වෙයි. නත්තල හේතුකොටගෙන සටන් විරාමයක් ඉල්ලූ අය බොහෝ ය. දෙමළ ජාතිවාදය යනු අන්කිසිවක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් සිංහලත්වයට එරෙහිව යොදාගනු ලැබෙන අවියක් පමණ ය. මෙරට ක්‍රිස්තියානි නූතනත්වයේ විවිධ නියෝජිතයෝ තමන් වෙනුවෙන් පරණ කඩේ මෙන් ම අළුත් කඩේ ද යන පස්ගව මහගුන් ද ලවා නත්තලට සටන් විරාම ඉල්ලවූහ. එහෙත් වෙනත් භික්ෂූන් වහන්සේ පවසා සිටියේ නත්තලට පමණක් නොව අනෙක් ආගමික වැදගත්කමක් ඇති දිනවලටත් සතර පෝයටත් සටන් විරාම දීමට ගියහොත් සටන් මෙහෙයුම්වලට දින සොයා ගැනීමට නොහැකි වන බව ය. ප්‍රභාකරන්ගේ මළගම පෙනි පෙනී සටන් විරාම ඉල්ලන්නේ කුමක් සඳහා ද යන්න පැහැදිලි ය. සිංහලත්වයට විරුද්ධව යොදාගත හැකි භික්ෂූන් වහන්සේ පිරිසක් නගරයේ ප්‍රධාන පන්සල් කිහිපයක ඇතිකර ගැනීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට හැකි වී ඇත. එදා උන්වහන්සේ ජාතික ව්‍යාපාරයට සේවය කළමුත් අද සිංහලයන්ට උන්වහන්සේලාගෙන් ප්‍රවේසම් වීමට සිදු වී තිබීම අභාග්‍යයකි. ඒ අතර කිවයුත්තක් වෙයි. මුළු ලෝකයම හිංසාවෙන්, අවි බලයෙන් භීෂණයෙන් තමන් යටතට පත්කරගත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අද ලංකාවේ සාමයක් ගැන කතාකරන්නේ ඔවුන්ට සිංහලත්වය නැතිකිරීමට කොටි සංවිධානය අවශ්‍ය බැවින් ඒ පවත්වාගෙන යෑමට මිස ඔවුන් සාමයට කැමති නිසා නො වේ. සාමයට කැමති නම් ක්‍රිස්තියානි නූතනත්වයේ හමුදා වහා ඉරාකයෙන් පිටවිය යුතු ය.

පළමු කරුණ ගැන බොහෝ අවස්ථාවල සඳහන් වී ඇති බැවින් දෙවැනි කරුණ ගැන වැඩියෙන් ලිවීමට සිදුවෙයි. ඒ බදු පැණවීම සම්බන්ධයෙනි. ජනාධිපතිතුමා පැවසූ පරිදිම විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය අතර පැහැදිලි බල බෙදීමක් වෙයි. එකක් අනෙකෙහි කාර්යයන්ට අත නොගැසිය යුතු ය. එසේ වුවහොත් සියල්ල අවුල් වී යනු ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි නියෝජිතයන්ට මෙරට විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර ගැටුමක් ඇතිකර රජය අස්ථාවර කිරීමේ අවශ්‍යතාව වෙයි. හුණුවටයේ කතාවේ අසඩැක් නීතිය රැකීමට ඒ බින්දේය. (නීති බින්දෝ ඒ රැකීමට). මෙහි දී වැදගත් වන්නේ රකින නීතිය කුමක් ද හා බිඳින නීතිය කුමක් ද යන්න ය. අසඩැක් රැකි නීතිය හා බිඳි නීතිය දෙකක් මිස එකක් නො වී ය.

මා කියවා ඇති පොත් අතරින් මගේ ජීවිතයට බලපා ඇත්තේ පොත් කිහිපයක් පමණකි. පෝල් ෆෙයරාබන්ඩ් මහතා විසින් ලියන ලද අගේන්ස්ට් මෙතඩ් යන්න ඉන් එකකි. එහි බටහිර අධ්‍යාපනය විසින් බිහිකෙරෙන බොරු විශේෂඥයන් ගැන ද කියැවෙයි. එහෙත් මේ විශේෂඥයන් උසාවියේ සාක්ෂිකරුවන් වූ අවස්ථාවල ඔවුහු නීතිඥයන් විසින් ප්‍රශ්න කෙරෙති. වෛද්‍ය, රසායන, අධ්‍යාපන ආදී විවිධ ක්ෂෙත්‍රවල විශේෂඥයන්ගෙන් ප්‍රශ්න කරන්නෝ ඒ ඒ ක්ෂෙත්‍රවල විශේෂඥයන් නොවූ නීතිඥයෝ ය. එහි කිසිදු වරදක් නැත. එහෙත් ප්‍රශ්නයක් වෙයි. නීතිඥයන් අතින් කෙරෙන වැරදි ප්‍රශ්න කෙරෙන්නේ කොතැනක ද? ඒ නීතිඥයන් ම සහභාගි වන තවත් අධිකරණයක් නොවිය යුතු ය.
ඇතැම් විට පාර්ලිමේන්තුවට එවැනි ප්‍රශ්න කිරීමක් කළ හැකි නමුදු ඒ සංකීර්ණය. නීතිඥයන්ගේ වැරදි ප්‍රශ්න කළ හැකි, නීතිඥයන් නොවන අයට එසේ ප්‍රශ්න කිරීමට හැකි, නීතිඥයන් විනිසුරුවරුන් නොවූ ආයතන තිබිය යුතු යැයි මම විශ්වාස කරමි. වෙනත් වචනවලින් කියන්නේ නම් අසඩැක්ලා වැන්නවුන් විනිසුරුවන් වූ ආයතන තිබිය යුතු ය.

එසේ නැතහොත් නීතියට අනෙක් ක්ෂෙත්‍රයකට නොමැති විශේෂත්වයක් හිමිවෙයි. ධුරාවලියක උඩින් ම සිටින පුද්ගලයකු හෝ ආයතනයක් හෝ සංවිධානයක් හෝ තිබීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එකඟ වෙයි. එහෙත් ඒ සිංහල බෞද්ධ චින්තනයට, සිංහල ජාතික චින්තනයට එකඟ නො වෙයි. ජාතික චින්තනය යනු කුමක් දැයි ඇසූ විට ඒ ගමේ චින්තනය යැයි කියන්නන් දන්නා ජාතික චින්තනයක් නැත. අපි ඔවුන් ගැන සැලකිලිමත් නො වෙමු. ජාතික චින්තනය යනු කුමක් දැයි තේරුම් කර දීමට හැකි තරුණයෝ රාශියක් මෙරට වෙති. සිංහල ජාතික චින්තනයෙහි න්‍යාය හා තර්කණය චක්‍රීය වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ චින්තනයේ තර්කණය ඒක රේඛීය වෙයි. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මුදුනෙහි පුද්ගලයකු හෝ ආයතනයක් හෝ ඇති ධුරාවලි වෙයි. ඒ සර්වබලධාරී

© Prof. Nalin De Silva

දෙවියන් වහන්සේගෙන් ගලා එන්නකි. එහෙත් පටිච්චසමුප්පන්නවාදීන් වූ අපට එවැනි ධුරාවලි නැත. අපට ඇත්තේ චක්‍ර ය. නිතියට අනෙක් ක්‍ෂෙත්‍ර ප්‍රශ්න කළ හැකි අයුරින් ම අනෙක් ක්‍ෂෙත්‍රවලට ද නීතිය ප්‍රශ්න කිරීමට හැකිවිය යුතු ය. ඒ සඳහා ආයතනයක් නිර්මාණය කිරීම පාර්ලිමේන්තුවට භාර ය. අනෙක් රටවල එවැනි ආයතන ඇත් ද නැත් ද යන්න මෙහි දී වැදගත් නො වේ. අප වැඩ කළ යුත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙන් අපට පැටවෙන අදහස් අනුව නොව පටිච්චසමුප්පන්නවාදී සිංහල ජාතික චින්තනයට අනුව ය.

බදු පැනවීමේ හා එයට උපරිම අවම සීමා නියම කිරීමේ අයිතිය ඇත්තේ කා හට ද? මෙහි දී බදු යනු කුමක් ද යන ප්‍රශ්නය පළමුව පැන නගී. අද නගරවල සිටින ''අයියලා'' ද ඇතැම් විට ඇතැමුන්ගෙන් මුදල් අය කරති. එහෙත් ඒ බදු නොව කප්පන් ය. ඇතැම් ආයතන ඉල්ලුම් පත්‍ර ගාස්තු පරීක්‍ෂාකිරීමේ ගාස්තු ආදිය අය කරයි. එහෙත් ඒ ද බදු නො වේ. ඒ යම් නිශ්චිත කාර්යයක් වෙනුවෙන් අය කරන ගාස්තුවකි. එහෙත් බදු යනු එසේ කෙරෙන අයකිරීම් නොව රජයේ නඩත්තුව සඳහා ජනතාවගෙන් වක්‍රව හෝ සෘජුව හෝ අය කරන මුදලකි. ඒ මුදල් අයකරන්නේ අහවල් නිශ්චිත කාර්යය කිරීම සඳහා නො වේ. ඒ බදු මුදල් විනිසුරුවන්ගේ වැටුප් ගෙවීම සඳහා මෙන් ම බන්ධනාගාරවල නඩත්තුව සඳහා ද යොදාගත හැකි ය. බදු ගෙවන්නෙක් තමන් බදු ගෙවන්නේ අහවල් නිශ්චිත කාර්යය කිරීම සඳහා ද යන්න නො දනියි. දැන් බදු අය කරන්නේ කවු ද යන ප්‍රශ්නය ගනිමු. මේ සම්බන්ධයෙන් කදිම උදාහරණයක් බටහිරින් ම වුව ද ගත හැකි ය. ඒ සංසිද්ධිය බොස්ටන් ටී පාටි හෙවත් බොස්ටන් තේ පැන් සංග්‍රහය නමින් හැඳින්වෙයි. ඇමරිකානු නිදහස් සටනේ දී ඇමරිකානු යටත්විජිතවලට ආනයනය කෙරුණු තේවලට බදු නියම කරන්නේ කවු ද යන ප්‍රශ්නය පැන නැංගේ ය. එහි දී යටත්විජිතවල විසූවන්ගේ තර්කය වූයේ ඔවුන්ගේ නියෝජිතයන් බ්‍රිතානි පාර්ලිමේන්තුවේ නොමැති බැවින් බ්‍රිතානි පාර්ලිමේන්තුවට එලෙස බදු නියම කිරීමට නොහැකි බව ය. මේ තර්කය වඩා සාධාරණයකිරීමෙන් හා වියුක්තකිරීමෙන් අපට මෙසේ කිව හැකි ය. යම් සමාජයක බදු නියම කළ හැක්කේ ඒ සමාජයට ම ය. මෙය සිංහල බෞද්ධ චින්තනයට ද එකඟ ය. බාහිර බලධාරියෝ එහි නො වෙති.

දැන් ප්‍රශ්නය වනුයේ සමාජය එහි දී ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න ය. සිංහල ජාතික චින්තනය අනුව ජනතාව විසින් විවිධ කාර්යයන් ඉටුකරවා ගැනීමට රාජ්‍යයක් පිහිටුවා ගනු ලැබේ. මේ අග්ගඤ්ඤ සූත්‍රය අනුව අප නිපදවා ගෙන ඇති ප්‍රවාදයකි. අද රාජ්‍යය කරවන්නේ ජනතාවගේ නියෝජිතයන් මගිනි. එහි දී පාර්ලිමේන්තුව (අවශ්‍ය නම් ජාතික සභාව) අවශ්‍ය නීති සම්පාදනය කරයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර දූෂිතයන්, වංචාකරුවන් ආදීන් සිටිය හැකි ය. එහෙත් ඔවුන් හා විනිසුරුවන්, නිලධාරීන් ආදීන් අතර වෙනසක් වෙයි. පසුව කී අය ජනතාවට වග නොකියති. ඔවුහු ජනතා ඡන්දයෙන් පත්වූවෝ නො වෙති. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ජනතාව ඉදිරියට යති. ඔවුහු සමාජය නියෝජනය කරති. ඔවුන් පත්වන්නේ  ම ජනතා ඡන්දයෙනි. ඔවුන්ගේ ක්‍රියා මැතිවරණයේ දී ජනතාවගේ විනිශ්චයට ලක් වෙයි. ජනතාවගේ නාමයෙන් ජනතාව වෙනුවෙන් ක්‍රියා කළ හැක්කේ ඔවුන්ට ය. සිංහල ජාතික චින්තනය අනුව වුව ද ජනතාව හා ඔවුන්ගේ නියෝජිතයන් අතර ඇත්තේ චක්‍රීය සම්බන්ධයකි. එබැවින් බදු පැනවීම මෙන් ම එහි සීමා නිර්ණය කිරීම ද පාර්ලිමේන්තුව සතු කාර්යයකි. මත්පැන් බොන්නන්ගේ යහපත හෝ අයහපත හෝ වෙනුවෙන් යැයි කියමින් මත්පැන් බද්ද සියයට සීයකට පමණක් සීමා කළ යුතු යැයි කීමට හැක්කේ කාහට ද? අනෙක් අතට ආණ්ඩුව නාස්ති කරන්නේ යැයි කියමින් වෙනත් ආයතනයකට බදු පැනවීම සම්බන්ධයෙන් මැදිහත්විය නොහැකි ය. නාස්තියට පිළියම වෙනත් එකකි.

රජය නඩත්තු වන්නේ විවිධ වූ බදු මුදලිනි. සමාජය ඉදිරියට යන්නේ බදු මුදල් යොදා ගැනීමෙනි. අද සමාජයට, රාජ්‍ය නොවන කාක්කන් ආදී බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නියෝජිතයන් හැරුණු විට අනෙක් අයට, අවශ්‍ය කොට් පරදවා ඒකීය රාජ්‍යය තවදුරටත් රැක ගැනීම ය. කවුරුන් හෝ එයට අකුල් හෙලන්නේ නම් සමාජයට අවශ්‍ය වූ විටක ඒ අය පෙරළා ගෙන යනු ඇත. ආයතන, පුද්ගලයන් ආදියට පැවැත්මක් ඇත්තේ සමාජයට ඒ අවශ්‍ය නම් පමණකි. සමාජ ප්‍රපංචවලට විරුද්ධවන අයට හා ආයතනවලට කෙතරම් වැදගත් කමක් හිමිවිය යුතු ද යන්න සමාජය විසින් ම අවසානයේ දී තීරණය කෙරෙනු ඇත. බොස්ටන් තේ පැන් සංග්‍රහයෙහි ප්‍රතිඵලයක් ලෙස බ්‍රිතානි පාර්ලිමේන්තුවට ඇමරිකානු යටත්විජිතවල බදු පැනවීමට නො හැකි විය. ලංකා රාජ්‍යයට අවශ්‍ය ආකාරයට තෙල්වලට බදු පැනවීමට නොහැකි  වුවහොත් කිනම් ආයතනයකට හෝ ආයතනවලට හෝ  කුමක් නැතිවේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva